**IOM සමගින් TIP Office ව්‍යාපෘතිය දියත් කිරීම**

ලබාදුන් හැඳින්වීම සම්බන්ධයෙන් සහ IOM හි ධූතමණ්ඩල ප්‍රධානී වශයෙන් ඔබ කරන වැඩ කටයුතු සම්බන්ධයෙන් සරත් දෂ් මහතාට මාගේ ස්තුතිය පල කරනවා. එමෙන්ම, මේජර් ජෙනරල් කුලතුංග මහතා, තැනැත්තන් වෙළඳාම් විරෝධී ජාතික කාර්ය සාධක බලකායේ සාමාජිකයින්, IOM හි මගේ සගයින් සහ අද දින මේ අවස්ථාවට  සහභාගිවන ඔබ හැමදෙනා වෙත මගේ සුභාශිංසන පිරිනමනවා.

ශ්‍රී ලාංකික සහ ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ හවුල්කාරිත්වයේ සහ සහයෝගීතාවයේ පදනමක් මත ගොඩනැගුණු කැපවීමක් වන, ශ්‍රී ලංකාවේ තැනැත්තන් වෙළඳාමට එරෙහි වැයම්වලට එක්සත් ජනපද රජයේ ඇති කැපවීම අද දිනයේ අප දියත් කරන වැඩසටහනින් අවධාරණය කෙරෙන නිසා මා අද මෙහි සිටින්නේ ඉතාමත් සතුටින්.

අන් අයගේ ජීවිත වැඩිදියුණු කිරීමේ පොදු අරමුණක් සඳහා කැප වූ වෘත්තිකයන්ගෙන් පිරුණු කාමරයක් දැකීම දිරිගන්වන සුළුයි. රාජ්‍ය මට්ටමින් වේවා,  ජාත්‍යන්තර සංවිධානයක් වශයෙන් වේවා, නැතිනම් සිවිල් සමාජ  කණ්ඩායමක් ලෙස බිම්මට්ටමේ වැයම්වලට උදවු ලබාදීම වේවා, ඔබේ මේ සෑම වෙහසකින්ම IMPACT, එනම් අදදිනයේ දියත්කරන ව්‍යාපෘතියේ අරමුණු මුදුන්පත් කරගැනීමට උදවු කළ හැකියි.

මේ ව්‍යාපෘතියේ සැලසුම සඳහා ලබාදුන් දායකත්වය වෙනුවෙන් තැනැත්තන් වෙළඳාම් විරෝධී ජාතික කාර්ය සාධක බලකාය වෙත ස්තුතිය පල කරන මෙන් වොෂින්ටනයේ අපේ කාර්යාල මගෙන් ඉල්ලා සිටියා. තැනැත්තන් වෙළඳාමට එරෙහිව සටන් කිරීමේදී අපගේ හවුල්කාරීත්වය තවදුරටත් ඉදිරියට ගෙනයාම සඳහා ඔබේ කැපවීම ඔවුන් අගය කරනවා.

තැනැත්තන් වෙළඳාම් විරෝධී ජාතික කාර්ය සාධක බලකායේ සම්බන්ධීකරණ කටයුතු සඳහා මයුරි පෙරේරා මහත්මිය දැරූ වෙහෙස පිළිගැනීමට ලක් කරන්නට මොහොතක් ගන්නට මා කැමතියි. විවිධ කාර්යාල දූසිම් ගණනක් රැස් කිරීමට සහ සිවිල් සමාජය සමඟ මෙම වැයම් සංවිධානය කිරීමට ඇය දැරූ වෙහෙස, IMPACT ව්‍යාපෘතිය දියත් කිරීම සඳහා සූදානම්වීමේදී බෙහෙවින් උපකාරී වූවා.

අප වාර්ෂිකව ජූලි 30 දින සමරනු ලබන තැනැත්තන් වෙළඳාමට එරෙහි ලෝක දිනය සැමරීමට සූදානම් වන මේ අවස්ථාවේදී අද දිනයේ මෙම කටයුත්ත සිදුවීම, ඊට සුවිශේෂී වැදගත්කමක් එක් කරනවා.

තැනැත්තන් වෙළඳාම ලොව පුරා සිටින මිනිසුන්ට බලපානවා. ඇත්ත වශයෙන්ම, ඕනෑම අවස්ථාවක ලොව පුරා වින්දිතයින් මිලියන 25 ක් සිටින බවට ඇස්තමේන්තු කර තිබෙනවා. තැනැත්තන් වෙළඳාමේ නිරතවන අය සෑම වයස්, පසුබිම් සහ ජාතීන්ට අයත් වැඩිහිටියන් හා ළමුන් ගොදුරු කර ගනිමින් ඔවුන්ව

තම ලාභය සඳහා යොදා ගනු ලබනවා. එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව ඇතුළුව ලෝකයේ සෑම රටක්ම මෙම අපරාධයෙන් පීඩා විඳිනවා.

IOM හි අපගේ හවුල්කරුවන් තැනැත්තන් වෙළඳාමේ ව්‍යසනයට එරෙහිව සටන් කිරීම සඳහා ශක්තිමත් ව්‍යාපෘතියක් සැලසුම් කර ඇති අතර, එයට Save the Children සහ ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 11 ක් පුරා සිටින තවත් සිවිල් සමාජ සංවිධාන හතරක ක්‍රියාකාරී සහභාගීත්වය ඇතුළත් වනවා. මේ රටේ TIP විරෝධී ප්‍රයත්න ඉදිරියට ගෙන යාමට අපට අවශ්‍ය බොහෝ අරමුණු මෙම ව්‍යාපෘතිය මගින් ආමන්ත්‍රණය කරනවා. ඊට පහත කරුණු ඇතුළත්:

- සාක්ෂි සුරක්ෂිත කිරීම, පරීක්ෂණ පැවැත්වීම සහ අපරාධ විමර්ශනය කිරීම සඳහා අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවට සහ විගමන දෙපාර්තමේන්තුවට තාක්ෂණික සහාය ලබා දීම.
- නීතිය බලාත්මක කිරීමේ බලධාරීන් සඳහා සම්මත මෙහෙයුම් කාර්ය පටිපාටි සංවර්ධනය කිරීම
- වින්දිතයන් පරීක්ෂා කිරීම සඳහා හොඳම ගෝලීය ප්‍රමිතීන් පිළිබඳව ආරක්ෂක හමුදා පුහුණු කිරීම.
- ප්‍රති ජාවාරම් ක්ෂණික ඇමතුම් අංකයක් සහ වෙනත් සේවාවන් සමඟ සම්බන්ධ වූ ශක්තිමත් මහජන තොරතුරු ව්‍යාපාරයක්.
- තැනැත්තන් වෙළඳාම ඵලදායී ලෙස හඳුනාගෙන වාර්තා කිරීමට මාධ්‍යවේදීන් පුහුණු කිරීම.
- තැනැත්තන් වෙළඳාමට ලක්වූවන්ට රැකවරණ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ එම රැකවරණ ස්ථානයට උපකරණ සැපයීම.

මෙම ව්‍යාපෘතිය හරහා ඉටුවනු ඇතැයි අපට බලාපොරොත්තු විය හැකි තවත් වැදගත් ක්‍රියාකාරකම් ගණනාවක් මට ලැයිස්තුගත කළ හැකියි. මෙම ව්‍යාපෘතිය සංවර්ධනය කිරීමේදී, සහය ලබාදීමේ ලිපි අටකට නොඅඩු ගණනක් ලබාදුන් විවිධ අමාත්‍යාංශ සමඟ IOM සෘජුවම කටයුතු කරනු ලැබුවා. රාජ්‍ය හවුල්කරුවන්ගේ ඒ සහය මෙම ව්‍යාපෘතිය සාර්ථක කරගැනීම සඳහා අත්‍යාවශ්‍ය වනවා.

වසර කිහිපයක සිටම අපේ තානාපති කාර්යාලය Development Partners නම් කණ්ඩායමකට සහභාගි වෙමින් අද දින මෙම කාමරයට රැස් වී සිටින සංවිධාන බොහොමයක් සමගින් තැනැත්තන් වෙළඳාම් විරෝධී මුලපිරීම් සම්බන්ධයෙන් කාර්තුවකට වරක් රැස්වී වසර ගණනාවක් තිස්සේ සාකච්ඡා පවත්වනවා. එක රැයකින් අපට සාර්ථකත්වයට ළඟාවන්නට බැහැ, අපට කන්දක් සෙලවිය හැක්කේ ක්‍රමක්‍රමයෙන් දරන වෑයම් හරහායි. මේ වසරේ Development Partners රැස්වීම් කිහිපයකට රජයේ කාර්යසාධක බලකායත් සහභාගි වූ අතර ඔවුන් සහයෝගයෙන් වැඩකිරීමට උනන්දුවෙන් පසුවනවා.

රජය රාජ්‍ය නොවන සංවිධාන සමගින් හවුල්වීමෙන් සාර්ථකත්වය පෙන්නුම්කර ඇති ක්ෂේත්‍රයක් වන මේ ක්ෂේත්‍රයේ ගැටළු සම්බන්ධයෙන් අප හවුල්කාරීත්වයෙන් වැඩකිරීම අත්‍යාවශ්‍යයි. ඒ හරහා, අප අතිරික්ත වැඩ අඩු කරගන්නවා පමණක් නොව, සහයෝගීතාවය අපගේ උත්සාහයන් ඒකාබද්ධ කරනවා.

අද දිනයේ සනිටුහන් කරන මෙම ආරම්භය, මේ අපරාධය මැඩලීම සඳහා සහයෝගීතාවය තවදුරටත් ඉදිරියට ගෙන යනවා. පසුගිය සතියේ, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ තැනැත්තන් වෙළඳාම මැඩලීම සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීම සඳහ වන කාර්යාලය තම වාර්ෂික තැනැත්තන් වෙළඳාම පිළිබඳ වාර්තාව (TIP) නිකුත් කළා. එම වාර්තාවේ Tier 2 Watchlist මට්ටමේ වසර තුනකට පසුව, ශ්‍රී ලංකාව මෙම වසරේ TIP වාර්තාවේ Tier 2 වෙත උත්ශ්‍රේණිගත වීමට තුඩු දෙමින් පසුගිය වසරේ රජය මිනිස් ජාවාරමට එරෙහිව සටන් කිරීමට ගත් වෑයම් වැඩිකිරීම අප අගය කරනවා.

තැනැත්තන් වෙළඳාම සම්බන්ධ විමර්ශන ශක්තිමත් කිරීම, වෙළඳාමට ගොදුරු වූවන් වැඩි වශයෙන් හඳුනා ගැනීම සහ රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය වැඩි කිරීම සඳහා විශේෂිත ඒකකයක් පිහිටුවීමට රජය දරන ලද උත්සාහය අපි අගය කරනවා. කෙසේ වෙතත්, තවමත් කළයුතු බොහෝ වැඩ තිබෙන අතර තැනැත්තන් වෙළඳාම්කරුවන් ඔවුන් කළ අපරාධවලට වගවන බව සහතික කරගැනීම සම්බන්ධයෙන් සහ විශේෂයෙන් වඩාත්ම අවදානමට ලක්විය හැකි පුද්ගලයින් සඳහා වින්දිත රැකවරණය ලබාදීම සම්බන්ධයෙන් ඉදිරි වර්ෂයේදී අඛණ්ඩව ප්‍රගතිය ලබනු දැකීමට අප උනන්දුවෙන් සිටිනවා.

ඉදිරි වසර තුළ තැනැත්තන් වෙළඳාම මැඩලීමේ ඔවුන්ගේ ප්‍රයත්නයන් තවදුරටත් ඉදිරියට ගෙන යාමේදී රජයන් සඳහා ප්‍රමුඛතා නිර්දේශ ලැයිස්තුවක් සෑම වසරකම TIP වාර්තාවට ඇතුළත් වනවා. මෙම නව ව්‍යාපෘතිය දියත් කිරීම සනිටුහන් කරන මේ අවස්ථාවේදී, 2022 TIP වාර්තාවේ ප්‍රධාන නිර්දේශ කිහිපයකට ම මේ ව්‍යාපෘතියෙන් සහාය වන බව අපව තවත් දිරිමත් කරනවා. ප්‍රෝත්සාහී ලෙස වින්දිතයින් හඳුනාගැනීම, වෙළඳාමට ලක් වූ පුද්ගලයින් සඳහා සේවා වැඩිදියුණු කිරීම සහ ළමා ලිංගික සංචාරක ව්‍යාපාරයට එරෙහිව සටන් කිරීමේ උත්සාහයන් ශක්තිමත් කිරීම ඊට ඇතුළත්. එසේම, ආරක්ෂිත සහ නීත්‍යානුකූල සංක්‍රමණය ප්‍රවර්ධනය කිරීමටත්, තැනැත්තන් වෙළඳාම යන අපරාධය සම්පූර්ණයෙන්ම ආමන්ත්‍රණය කිරීම සඳහා අඛණ්ඩව රාජ්‍ය සම්බන්ධීකරණය සඳහා පහසුකම් සැලසීමට ගන්නා ක්‍රියාමාර්ග ද ඊට ඇතුළත්.

මෙම නිර්දේශ ඉටු කිරීම පහසු කාර්යයක් නොවනු ඇතත්, තැනැත්තන් වෙළඳාමට විසඳුම් සෙවීමට අප එක්ව කටයුතු කරන විට ඊට සහාය වීම සඳහා එක්සත් ජනපදය සූදානම් බව ඔබට සහතික කිරීමට මට අවශ්‍යයි. එක්සත් ජනපද තානාපති කාර්යාලයේ, ශ්‍රී ලංකා රජයේ සහ සිවිල් සමාජය තුළ අප කරන කාර්යයන්හි අරමුණ වන්නේ කිසිදු වින්දිතයකු අදෘශ්‍යමාන නොවන බවත්, කිසිදු මිනිස් වෙළඳාම්

කරුවකුට අවදානමේ සිටින ජනයා හෝ ප්‍රජාවන් තමන්ගේ වාසියට යොදාගැනීමට නොහැකි වන බවත් සහතික කරගැනීමයි.

අප ඉදිරියට කටයුතු කරගෙන යෑමේදී තැනැත්තන් වෙළඳාම්කරුවන්ට නඩු පවරන්නේ කෙසේද වින්දිතයන් ආරක්ෂා කරන්නේ කෙසේද සහ අපරාධය මුලින් සිදුවීම වළක්වා ගන්නේ කෙසේද යන්න පමණක් නොව වින්දිතයින් වියහැකි පුද්ගලයින් ආරක්ෂා කිරීම සහ දිවි ගලවා ගත් අයට උපකාර කිරීම සඳහා සමාජය තුළ සමාජ ව්‍යුහයන් ගොඩනගන්නේ කෙසේද යන්න සලකා බැලීම වැදගත් වනවා. දශක ගණනාවකට පසු ශ්‍රී ලංකාව මුහුණදෙන විශාලතම ආර්ථික අර්බුදය පවතින මේ අවස්ථාවේ එය වෙන කවරදාටත් වඩා වැදගත් වේවි.

IMPACT ව්‍යාපෘතිය එහි වචනාර්ථ අනුව යමින්, එනම් බලපෑමක් ඇති කරමින් බලාපොරොත්තු ඇතිකරවනු ඇතැයි අප අපේක්ෂා කරනවා. මෙරට තැනැත්තන් වෙළඳාමට එරෙහිව සටන් කිරීම සඳහා රජයට සහ සිවිල් සමාජයට ඇති හැකියාව ශක්තිමත් කිරීමේ වැයම්වලට එක්සත් ජනපදය සැමවිටම සහාය දෙනු ඇති. මෙම වැඩසටහන දියත් කිරීමත් සමඟ, අපට පසුගිය වසරේ මේ සම්බන්ධයෙන් ඇතිවූ උද්යෝගය සහ ක්‍රියාකාරීත්වය ඉදිරි වසර දක්වා ගෙන යා හැකියි.

මේ සටනට අප සමගින් එක් වූ ඔබ හැමදෙනාටම ස්තුතියි; ඉදිරි වසරවලදීත් තැනැත්තන් වෙළඳාම මැඩලීම සඳහා අපේ හවුල්කාරීත්වය අඛණ්ඩව පවත්වාගෙන යෑමට අප උද්යෝගයෙන් සිටිනවා. එක්සත් ජනපදය මිනිස් වෙළඳාමට එරෙහිව සටන් වැදීමට කැපවී සිටින්නේ මිනිස් වෙළඳාම හේතුවෙන් සමාජ අස්ථාවර වීම, ආර්ථික දුර්වල කිරීම, ශ්‍රමිකයින්ට හානි කිරීම, සූරාකන්නන් තවත් පොහොසත් කිරීම, නීත්‍යානුකූල ව්‍යාපාරවලට හිමිවිය යුතු තැන් ඔවුන් විසින් අත්පත් කරගැනීම සිදුවන නිසා සහ, ප්‍රධාන වශයෙන්ම එය අත්‍යාන්තයෙන්ම වැරදි ක්‍රියාවක් වන නිසායි.

අප සාකච්ඡා කරන මේ සියළු ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ක්‍රියාකාරකම් පසුපස සිටින්නේ සැබෑ මිනිසුන්, සැබෑ වින්දිතයින් බව අපි හැමදෙනාම මතක තබාගනිමු. ඒ අපේ සහෝදරියන්, පුතුන්, මවුවරුන් සහ මාමාවරුන්. ඔවුන්ට යළිත් තම දිවියේ ගරුත්වය ළඟාකරගැනීමට උදවු දීමෙන් අප කරන්නේ බලාපොරොත්තුවට යළි පණ දීමයි.

මේ අවුරුද්දේ TIP වාර්තාව එළිදැක්වීමේ අවස්ථාවෙහි බ්ලින්කන් ලේකම්තුමා "තැනැත්තන් වෙළඳාම මගින්, නිදහසේ දිවිගෙවන්නට, එනම්, තමන් කැමති දෙයක් කරන්නට, තමන් කැමති අයෙක් වන්නට, තමන්ගේ බලාපොරොත්තුව වන ජීවිතය ගොඩනගා ගන්නට සියළු දෙනාට ඇති අයිතීන් උල්ලංඝනය කරනවා" යනුවෙන් සඳහන් කළා.

සෑම තැනැත්තෙකුටම ඒ අයිතීන් සහ නිදහස ලැබෙන බව සහතික කරගන්නට අපි හැමදෙනා වෙහෙසෙමු.